භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව

திறைசேரி செயற்பாடுகள் திணைக்களம்

**Department of Treasury Operations**

මහ භාණ්ඩාගාරය, මුදල් අමාත්‍යාංශය, තැ.පෙ. 1559, කොළඹ 01

General Treasury, Ministry of Finance, P. O. Box 1559, Colombo 01.

අධ්‍යක්ෂ ජනරාල් / Director General: 2484729, laliths@sad.gov.lk

ෆැක්ස් / Fax: (94-11) 2320042

General: 2484500, 2484600


මගේ අංකය / My No. විඕඩී/සීඑෆ්/ජ්‍ෂයිඑල්/2005

ඔබේ අංකය / Your No.

දිනය / Date 2004.12.09

(2)

## භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛ අංක : 03/2004

ප්‍රධාන ගණකාධිකාරීගේ විශේෂ අවධානය පිණිස.

සියලුම අමාත්‍යාංශ ලේකම්වරු,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරු,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

### 2005 වර්ෂයේ අක්මුදල් සීමාවන් තීරණය කිරීම හා වාර්ෂික අක්මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත් කිරීම

2005 වසර සඳහා පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද ඇස්තමේන්තු පදනම් කර ගෙන 2005 වසර වෙනුවෙන් අක්මුදල් සීමා තීරණය කිරීම සඳහා වන අයදුම්පත හා වාර්ෂික අක්මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකසා ඉදිරිපත් කරන ලෙස මෙයින් දන්වා සිටිමි.

02. 2005 වර්ෂය වෙනුවෙන් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවලට නියමිත අග්‍රිම සීමා නියම කිරීම දැන් ආරම්භ ඇති අතර, ඒ අනුව පුනරාවර්තන වියදම් (පුද්ගල පඩිනඩි) සඳහා වූ ප්‍රතිපාදන මත ගණන් බැලෙන අක්මුදල් සීමාව තීරණය කිරීමේදී පහත සඳහන් අඩු කිරීම් සැලකිල්ලට ගත යුතුය. (සටහන "ආ" බලන්න)

(i) වැ.අ.වි.වැ. වෙනුවෙන් වැටුප් හා වේතන සඳහා වූ ප්‍රතිපාදනයෙන් 6% ක්

(ii) ~~රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ අවම බැර සීමාවට සමාන මුදලක්~~

(iii) රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ ණය සඳහා වන පොලී අය කිරීම්

මීට අමතරව සමස්ථ අක්මුදල් සීමාව ගණනය බැලීම සඳහා පහත දැක්වෙන තොරතුරු මෙම දෙපාර්තමේන්තුවට අවශ්‍ය වේ.

(අ) එක් එක් මාසයේදී ආදායම් වශයෙන් මුදලින් රැස් කර ගැනීමට අපේක්ෂා කරනු ලබන වටිනාකම. (2004 ජනවාරි මස සිට ඔක්තෝබර් 31 දක්වා සත්‍ය වශයෙන් මුදලින් ලද ආදායම මාසිකව සඳහන් කළ යුතුවේ.) (සටහන "ඉ" බලන්න.)

(ආ) ඔබ ආයතනය වෙනත් අමාත්‍යාංශ දෙපාර්තමේන්තු හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත යම් ගෙවීම් සඳහා ප්‍රතිපාදන වෙන් කර දෙනු ලබන්නේ නම් එසේ වෙන් කර දෙනු ලබන මුළු ප්‍රතිපාදන ප්‍රමාණයන් සහ එම ප්‍රතිපාදන ලබා දෙන ආයතන පිළිබඳ විස්තර. (ආකෘතියේ II "අ" අනුව)


...ector (Cash Flows & Consolidated ...unds Management) ... : 2484738 ...ail : padma...@sad.gov.lk

Director (Borrowings) Tele. : 2484739 E-mail : silvah...@sad.gov.lk

Director (Revenue) Tele. : 2484741 E-mail : amanda...@sad.gov.lk

Director (Debt Servicing & Accounting) Tele. : 2484748 E-mail : jayathilaka...@sad.gov.lk ... 2484628

(ඇ) ඉහත 2(i), 2(ii) හා 2(iii) ට අමතරව, යාරස් සටහන් මගින් ගිණුම් ගත කිරීමට අපේක්ෂා කරනු ලබන වෙනත් වියදම් ඇත්නම් ඒ පිළිබඳ විස්තර.

(ඈ) 2004 හෝ ඊට පෙර වර්ෂවලදී තුන්වන පාර්ශවයන්ගෙන් පොදු තැන්පත් ගිණුම සටහනේ රැස් කර ඇති මුදල් ඇතොත්, ඒවා ආපසු ගෙවීම වෙනුවෙන් වූ මාසික මුදල් අවශ්‍යතාවයන් පිළිබඳ විස්තරයක්.

(ඉ) යම්කිසි අමාත්‍යාංශයක්, භාණ්ඩාගාරයෙන් ලබා ගන්නා අත්මුදල් උපයෝගී කර ගෙන එම අමාත්‍යාංශයට අයත් ව්‍යවස්ථාපිත මණ්ඩලයකට අරමුදල් නිදහස් කරනු ලබන්නේ නම් එවැනි අමාත්‍යාංශ, ඒ පිළිබඳ විස්තරයක් ද මේ සමග ඉදිරිපත් කළ යුතු වේ.

(ඊ) මෙයට අමුණා ඇති ආකෘති පත්‍ර සම්පූර්ණ කිරීම සඳහා ඔබ විසින් යොදා ගනු ලබන උපකල්පයන් සහ ගණනය කිරීම් වෙනමම විස්තරාත්මකව ඉදිරිපත් කළ යුතුවේ.

තවදුරටත් අවශ්‍ය පැහැදිලි කිරීම් ලබා ගැනීම අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා පහත නම් සඳහන් නිලධාරීන් ඇමතිය හැක.

1. ඩී.ජී.ආර්. සේනාධිපති මහත්මිය - අධ්‍යක්ෂ දුරකථනය 2484738

ක්ෂේත්‍ර සම්බන්ධීකරණ නිලධාරීන් :-

| | | | | |
|---|---|---|---|---|
| 1. | එච්.සී.ඩී.එල්. සිල්වා මහතා | - රාජ්‍ය ආරක්ෂාව (රාජ්‍ය පරිපාලනය) | දුරකථනය | 2484739 |
| 2. | ජේ.සී. වැලිගමගේ මෙනෙවිය | - යටිතල පහසුකම් සංවර්ධනය<br>ව්‍යවසාය සංවර්ධනය | දුරකථනය | 2484743 |
| 3. | ශානිකා අමරදාස මහත්මිය | - සිවිල් පරිපාලනය | දුරකථනය | 2484744 |
| 4. | ඒ.එන්.හපුගල මහතා | - මානව සම්පත් සංවර්ධනය<br>කලාව සංස්කෘතික හා බෞද්ධ කටයුතු | දුරකථනය | 2484740 |
| 5. | ආර්.ඒ.එම්. ලක්ෂ්මන් මහතා | - ග්‍රාමීය සංවර්ධන හා දිළිඳුකම පිටුදැකීම<br>කෘෂිකර්ම අංශය | දුරකථනය | 2484742 |

මෙම විස්තර 2004.12.31 දිනට හෝ ඊට ප්‍රථමයෙන් මෙම දෙපාර්තමේන්තුවට ලැබීමට සලස්වන මෙන් දන්වා සිටිමි.

(අත්සන)
ලලිත් ආර්. ද සිල්වා
අධ්‍යක්ෂ ජනරාල්,
භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව

පිටපත :- විගණකාධිපති

සටහන් :